හෝමාගම ප්‍රාදේශීය සභාව
කොළඹ දිස්ත්‍රික්කය
-------------------------------

**1.** මූල්‍ය ප්‍රකාශන
-----------------

**1**.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුලි 08 දින සභාවේ ලේකම්වරිය වෙත යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට හෝමාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------

1.3.**1** ගිණුම්කරණ අඩුපාඩු
---------------------
පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මන්ත්‍රීවරු තිදෙනෙකුට ගෙවන ලද රු.**8**,000 ක දුරකථන දීමනාව ගෙවිය යුතු ලෙස සළකා දුරකථන ගිණුම හර කොට ණයහිමි ගිණුම බැර කිරීම හේතුවෙන් දුරකථන වියදම් ගිණුම සහ ණයහිමි ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලයේ 2015 දෙසැම්බර් මස විදුලි බිල රු.78,387 ක් වුවද එය විදුලි වියදම් ගිණුමේ සහ ණය හිමි ගිණුමේ රු.90,000 ක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් එම ගිණුම් රු.11,613 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2015 මාර්තු 25 වන දින සභා භූමිය තුල පිහිටි ලේඛනාගාර ගොඩනැගිල්ලේ ගින්නෙන් සිදු වූ අලාභය රු.1,202,867 ලෙස තක්සේරු කර තිබුණ ද එය මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ලංකා බැංකු පොදු මුදල් ගිණුම සඳහා 2015 අගෝස්තු මාසයේ පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශණයේ වටිනාකම රු.361,288 ක්වූ හඳුනානොගත් තැන්පත් ශේෂයක් නිරවුල් කර ගිණුම් ගත නොකිරීම හේතුවෙන් 2015 අගෝස්තු සිට මේ දක්වා බැංකු සැසඳුම් වාර්තා වල මෙම ශේෂය දිගින් දිගටම පැවත එමින් තිබුණි.

(ඉ) ප්‍රධාන කාර්යාලයේ 2015 දෙසැම්බර් මස ජල බිල්පත සඳහා රු.25,914 ක අයි වෙන් කිරීමක් සිදු කර තිබීම හේතුවෙන් වර්ෂයේ ජල ගාස්තු වියදම සහ ණයහිමි ගිණුම රු.25,914 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුලදී පළාත් පාලන අමාත්‍යාංශයෙන් සභාව වෙත පරිත්‍යාග කරන ලද වාහන 3 ක වටිනාකම රු.20,907,473 ක් ගිණුම්ගත කර නොතිබූ අතර එම වාහන සභාවට පවරා ගැනීමට විගණිත දිනය වූ 2016 අප්‍රේල් 29 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගෙවිය යුතු වටිනාකම රු.203,742 ක් වූ මුද්දර බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවා නොතිබුණි.

(ඌ) 2015 වර්ෂයේ ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් යෙදවුම් බද්ද හා නිමවුම් බද්ද හිලව් කිරීමේදී රු.623,804 ක ලැබිය යුතු ශේෂයක් පැවතියද මූල්‍ය ප්‍රකාශණ වල ජංගම වගකීම් යටතේ හර ශේෂයක් ලෙස දක්වා තිබුණි.

1.3.2 නීති රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම
-------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2012 හි 3.3 ඡේදය ප්‍රකාරව එක් සමිතියකට කොන්ත්‍රාත් 03 කට වඩා ලබා දිය නොහැකි වුවද කොන්ත්‍රාත් 154 ක්, එක් සමිතියකට තුනකට වඩා වැඩි වන ලෙස ලබා දී තිබුණි.

(ආ) වසර 02 කට පෙර සිට පැවත එන රු.3,039,929 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 (2) (ආ) ප්‍රකාරව දෙන ලද අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය නිම කළ වහාම පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන දිනට වසර 5 සිට 13 දක්වා කාලයක සිට නොපියවා ඇති අත්තිකාරම් 04 කට අදාලව රු.60,500 ක ශේෂයක් විය.

(ඈ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 751 (1) ප්‍රකාරව ලැබෙන සියළුම භාණ්ඩ බඩුලේඛණ/තොග ලෙජර් වල සටහන් කල යුතු වුවත් සභාවේ සියළු ආදාහනාගාර වල හා ලෙනගල ප්‍රජා ශාලාවේ ඇති භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ගත කර නඩත්තු කර නොතිබූ අතර පුස්තකාල හා පෙර පාසැල් කිහිපයක ඉන්වෙන්ට්‍රි ලේඛණද යාවත් කාලීන කර නොතිබුණි.

1.3.3 අසම්භාව්‍ය බැරකම්
----------------------

සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් පවරා තිබූ නඩු 02ක් ක්‍රියාත්මකව පැවතුණ ද. ඒ පිළිබඳව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

1.3.4 නොසැසඳෙන පාලන ගිණුම්
------------------------------

ගිණුම් විෂයයන් 08 කට අදාලව ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.336,195,933 ක් වූ අතර ඒවාට අදාල උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ එකතුව රු.258,194,607 ක් වුයෙන් රු.78,001,326 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.5 නිරවුල් නොකරන ලද ගිණුම්
---------------------------------

වර්ෂ ගණනාවක සිට පැවත එන ගිණුම් විෂයයන් 03 කට අදාල එකතු වටිනාකම රු.169,582 ක් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් පැවතුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම
--------------------------------

(අ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම
----------------------------------------

එකතුව රු.80,670,085 ක් වු ගිණුම් විෂයයන් 04 ක ශේෂයන්ට අදාල විගණන සාක්ෂි නොමැතිවිම හේතුවෙන් සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) පිළිතුරු නොලත් විගණන විමසුම්
--------------------------------------

2015 මැයි 30 දින වන විට වටිනාකම රු. 5,670,159 ක් වූ විගණන විමසුම් 01 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
-------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.125,868,478 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 124,487,286 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
--------------------------------------------------------------

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ජනවාරි 01 දිනට හිඟ ශේෂය | වර්ෂයේ බිල් කිරීම | තථ්‍ය අයකර ගැනීම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 49,580,012 | 33,395,852 | 39,130,776 | 43,952,848 |
| කඩකුලී | 4,098,764 | 5,176,350 | 7,697,306 | 1,577,808 |
| විනෝද බදු | 67,115 | 601,720 | 633,920 | 34,915 |

2.2.2 වරිපනම් බදු
--------------

2015 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු හිඟ ශේෂය රු.43,952,848 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 11 කින් වර්ධනය වී තිබුණි.

2.2.3 කඩකුලී
---------

(අ) 2015 දෙසැම්බර් 31 දිනට රු.1,577,808 ක් වූ හිඟ කඩ කුලී ශේෂය තුල දීර්ඝ කාලයක සිට අයවිය යුතුව තිබූ සති පොළ කඩ කුලී රු.271,215 ක් ද ඇතුලත් වී තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.271,215 ක් වූ හෝමාගම සති පොලෙහි හිඟ කඩ කුලී මුදල් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
--------------------------

3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

(අ) සභා බල ප්‍රදේශය තුල සුසාන භූමි 36 ක් පැවති අතර සමාලෝචිත වර්ෂය තුල සුසාන භූමි වෙන් කිරීමෙන් ලද ආදායම රු.186,000 ක් වූ නමුත් එම සියළු සුසාන භූමි සඳහා ප්‍රමාණවත් සේවකයන් යොදවා නිසිලෙස නඩත්තු කර නොතිබුණි.

(ආ) දියගම මාතෘ සායනය වසා දමා තිබීම නිසා ගැබිනි මාතාවන්ට එයින් ලබා ගත හැකිව තිබූ සේවාවන් අහිමිව ගොස් තිබුණි.

(ඇ) 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 4/2015 හි 02 වගන්තියට පටහැනිව සභාවේ ට්‍රැක්ටර් 05 ක් රක්ෂණය කිරීමට රක්ෂණ නියෝජිතයෙකුට රු.56,308 ක් ගෙවා තිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු
--------------------

(අ) දේශපාලන නායකයකුට සුභ පැතීම සඳහා පුවත්පත් දැන්වීමක් පල කිරීමට සමාලෝචිත වර්ෂයේදී රු.156,800 ක් ගෙවා තිබීම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියෙන් ආවරණය නොවන වියදමක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී රු.1,944,000 ක් වටිනා ලැප්ටොප් පරිගණක 12 ක් මිලදී ගැනිමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

3.3 සේවක ණය
---------------

2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂවල එකතුව රු. 13,508,287 ක් වූ අතර ඉන් ස්ථාන මාරු වී ගිය හා විශ්‍රාම ගිය අයගේ හිඟ ණය ශේෂය රු.2,084,723 ක් විය. එම ශේෂයන් අයකර ගැනීමට ද කටයුතු කර නොතිබූ අතර හිඟ ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක්ද ඉදිරිපත් කර නොතිබුණි.

3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
----------------------------------------

එකතු වටිනාකම රු.1,390,625 ක් වූ වාහන 02 ක් සහ වටිනාකම සොයාගත නොහැකි වාහන 03 ක් 2015 දෙසැම්බර් 31 දිනට ඌන උපයෝජිතව තිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය
----------------------------

සමාලෝචිත වර්ෂය තුලදී කර්මාන්ත 662 කින් රු.224,886,363 ක පිරිවැයක් දරා කර්මාන්ත 525 ක් නිම කර තිබුණු අතර ඉදිරි වර්ෂයේදී නිම කිරීම සඳහා කර්මාන්ත 48 ක් පැවතුණි. කර්මාන්ත 85 ක් අතහැර දමා තිබුණි.

3.6 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
---------------------------------

සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශයෙන් මසකට බැහැර කරනු ලබන කසල ප්‍රමාණය ටොන් 753-1074 දක්වා වූ පරාසයක පැවති අතර වර්ෂය තුල එකතු කරන ලද කසල ටොන් 11,179 ක් කරදියාන කසල අංගනයට බැහැර කර තිබුණි. ඒ වෙනුවෙන් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වෙත රු.6,665,223ක් ද, කසල ප්‍රවාහනය සඳහා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු වෙත රු.10,305,120ක් ද වශයෙන් එකතුව රු.16,970,343 ක් කසල කළමනාකරණය සඳහා වැයකර තිබුණි. ප්‍රදේශයේ කසල ගැටළුවට විසඳුමක් ලෙස නිවෙස් හිමියන්ට කොම්පොස්ට් බැරල් ලබා දී නිවෙස් තුලම කසල බැහැර කරලීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබූ අතර ට්‍රැක්ටර් මගින් නොදිරන කසල පමණක් එකතු කිරීමට සැළසුම් කර ක්‍රියාත්මකව පැවතියද, පිරිවැය අවම කර ගැනීම සඳහා එම වැඩසටහන තව දුරටත් පුළුල් කළ යුතු බව විගණනයේදී යෝජනා කරනු ලැබේ.

4. ගුණාත්මකභාවය හා යහපාලනය
----------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
-----------------------

2015 වර්ෂයට අදාලව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.2 ක්‍රියාකාරී සැලැස්ම
------------------

2014 පෙබරවාරි 11 දිනැති අංක PFD/RED/01/01/2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වන ඡේදයේ විධිවිධාන අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි.

4.3 විගණන හා කළමණාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2003 ජුනි 03 දිනැති අංක PED 12 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂයක් තුල පැවැත්විය යුතු අවම විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව පවත්වා නොතිබුණි.

5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) තොග පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) කොන්ත්‍රාත් පාලනය
(ඊ) අභ්‍යන්තර විගණනය